## <u>ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයේ අධ්‍යාපනය ලබන ශිෂ්‍ය භික්ෂූන් වහන්සේ විසින් දෙනු ලබන ප්‍රතිඥා පත්‍රය</u>

..................................................................................(ශිෂ්‍යයාගේ සම්පූර්ණ නම) වන මම අවංකවත් සත්‍යවත් පහත සඳහන් පරිදි ප්‍රතිඥා දී පොරොන්දු වෙමි.

අනුරාධපුර ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයේ ශිෂ්‍ය භික්ෂුවක් වශයෙන් මම, ආචාරශීලි පැවැත්මෙන් යුතුව විශ්වවිද්‍යාලයේ පිළිගත් නීතිරීතිවලට අනුගත වෙමින් නිරතුරුවම ක්‍රියාකරන බවටත්, ශිෂ්‍ය භික්ෂු විනය ආරක්ෂා කරන අතර විෂමාචාර ක්‍රියාවලින් වැළකී සිටීමටත් මෙයින් පොරොන්දු වෙමි.

01. භික්ෂුවක් ලෙසින් මෙහි ශිෂ්‍යභාවය තිබෙන තුරු මනා පැවැත්මෙන් යුතුව කල් ගෙවීමටත් ශිෂ්‍ය භික්ෂුභාවය තිබෙන තුරු උපාධි අපේක්ෂකයෙකු ලෙස විනීතව හැසිරීමට වග බලා ගැනීමටත් පොරොන්දු වෙමි.

02. විධිමත් පරිදි ලබා ගත් අවසරයකින් තොරව හා සාධාරණ හේතු රහිතව එක් අධ්‍යයන වර්ෂයක් තුළ දී දින 07 කට වඩා කාලයක් දේශන හා ප්‍රායෝගික පන්තිවලට සහභාගි නොවීමෙන් විශ්වවිද්‍යාලයෙන් විවිධ දඬුවම් පැමිණවීමට ඉඩ ඇති බැවින් මම ඒ බව වටහාගෙන එයට නිරතුරුවම අවනත වී ක්‍රියා කරන බවට පොරොන්දු වෙමි.

03. දේශන හා වැඩමුළුවලට නියමිත කාලසටහනට අනුව සහභාගි වනු මිස මගේ අභිමතයට අනුව කාල සටහන් වෙනස් කරවා ගැනීමට හෝ ඒවායේ නියමිත කටයුතුවලට බාධා පැමිණවීමට හෝ අනවශ්‍ය ගැටලු ඇති කිරීමට හෝ ක්‍රියා නොකරන අතර පන්ති පැවැත්වෙන අතරතුරදී වරින්වර පන්තිවලට ඇතුළුවීම හෝ පිටවීම ආදිය ද නොකරන බවට පොරොන්දු වෙමි.

04. විශ්වවිද්‍යාලයේ කීර්තිනාමය රැක ගැනීම මාගේ යුතුකමකි. එයට හානිකර වන අයුරින් කටයුතු මම නොකරමි. තවද අධ්‍යාපන කටයුතුවලට හෝ විභාග කටයුතුවලට හෝ පරිපාලන කටයුතුවලට හෝ විශ්වවිද්‍යාලයේ අනුමැතියෙන් සිදුකරන වෙනත් කාර්යයකට හෝ බාධා වන අයුරින් කටයුතු නොකිරීමටත් පොරොන්දු වෙමි.

05. විශ්වවිද්‍යාලයේ අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ නිලධාරියෙකුගේ හෝ වෙනත් සේවකයෙකුගේ හෝ රාජකාරි කටයුතුවලට අවහිර හෝ බාධාවන අයුරින් කටයුතු නොකරන අතර එවැනි අයට අපහාස කිරීම් හෝ නින්දා කිරීම් ආදිය ද නුසුදුසු බව මම පිළිගනිමි.

06. මා වෙත නිකුත් කර ඇති ශිෂ්‍ය භික්ෂු වාර්තා පොත, මහෝපාධ්‍යායයන් වහන්සේ, විශ්වවිද්‍යාල ආචාර්ය මණ්ඩලයේ සාමාජිකයෙකු, මෙහි පරිපාලනයට සම්බන්ධ නිලධාරියෙකු, මහෝපාධ්‍යායයන් වහන්සේ හෝ ලේඛකාධිකාරි විසින් බලය පවරා ඇති යම් තැනැත්තෙකු හෝ ආරක්ෂක අංශයේ තැනැත්තෙකු හෝ ඉල්ලා සිටින විට ලබා දීමට මම බැඳී සිටින බවට පොරොන්දු වෙමි.

07. මෙම විශ්වවිද්‍යාල ආයතනයේ දේපල (විශ්වවිද්‍යාල භූමිය, ගොඩනැගිලි, තාප්ප, පාරවල් සහ වෙනත් ද්‍රව්‍ය වස්තූන්) ආදිය මගේ අධ්‍යාපනික අභිවෘද්ධිය සඳහා රජය මගින් මහජන ආධාර මත ලබා දී ඇති ඒවා බව නිරතුරුවම සිහිකර ගනිමින් ඒවා සුරක්ෂිත කර ගැනීමට පියවර ගන්නා අතර එය මාගේ යුතුකමක් ලෙස ද සළකමි. ඒවාට අලාභහානි කිරීම, විධිමත් අවසරයකින් තොරව විශ්වවිද්‍යාලයෙන් බැහැර කිරීම, ඒවා මා සතු කර ගැනීම, අන්සතු කරවීම ආදි කිසිවක් ද නොකරන බවට පොරොන්දු වෙමි.

08. ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමයට අනුගතව තම මතවාද හා අදහස් නිදහස්ව ඉදිරිපත් කිරීමේ අයිතිය පිළිබඳව මම මනා අවබෝධයක් ඇතිව කටයුතු කරන අතර මට ඇති වන ගැටලු සහ ප්‍රශ්න ආදිය මා භික්ෂූන් වහන්සේ නමක් බවද මෙනෙහි කොට ඒවා රළු පරුෂ අයුරින් නොව සාකච්ඡා මාර්ගයෙන් බුද්ධිමත්ව විසඳා ගැනීමට කටයුතු කරමි. විශ්වවිද්‍යාලයේ දේපලවලට එමගින් කිසිදු හානියක් හෝ ඒවා විකෘති කිරීමක් හෝ නොවන අයුරින් නිරන්තරයෙන්ම කටයුතු කරන බවට පොරෙන්දු වෙමි.

09. ශිෂ්‍ය භික්ෂූන් වහන්සේ නමකට කායිකව හෝ වාචිකව හෝ මානසිකව හෝ කිසිදු බලපෑමක් පීඩාවක් නොකරන අතර එවැනි ක්‍රියාකාරකම්වලට අනුබලයක් දැක්වීමක් හෝ අවනත වීම ආදිය ද නොකරන බවටත් වෙසෙසින්ම නවකවදය දීමේ ආදි කාර්යයන් කිසිසේත් නොකරන බවටත් පොරොන්දු වෙමි.

10. විශ්වවිද්‍යාලය විසින් අනුමත කරන ලද ව්‍යවස්ථා හා රෙගුලාසි අනුව පිහිටුවන ලද ශිෂ්‍ය භික්ෂු සුභසාධක සංගමය හා විශ්වවිද්‍යාලයේ අනුමැතිය ලැබ පිහිටුවනු ලබන වෙනත් සංගම් හැර වෙනත් කිසිම සංවිධානයක්, සමාජයක්, විශ්වවිද්‍යාලය ඇතුළත ආරම්භ කිරීම, ඒවායේ කටයුතු සංවිධානය කිරීම, පවත්වාගෙන යාම, එවැනි සංවිධාන කටයුතුවලට සහභාගී වීම, එවැනි වැඩවලට ආධාර දීම සහ අනුබල දීම ආදිය නොකරන බවට පොරොන්දු වෙමි.

11. අධ්‍යාපන කටයුතුවලදී පැන නැගෙන ගැටලු සුහදව හා සාකච්ඡාවෙන් විසඳාගැනීමට ක්‍රියාකරනු මිස ඒවාට අභියෝග කරමින්, විරුද්ධ වෙමින් කටයුතු නොකරන බවට පොරොන්දු වෙමි.

12. මහෝපාධ්‍යායයන් වහන්සේගේ ලිඛිත පූර්ව අනුමැතියක් නොමැතිව විශ්වවිද්‍යාලය තුළ හෝ විශ්වවිද්‍යාල පරිශ්‍රය ඇතුළත රැස්වීම්, පෙරහැර, උත්සව ආදිය සංවිධානය නොකරන අතර එවැනි කටයුත්තකට ආධාර දීම හෝ අනුබල දීම හෝ සහභාගි වීම, බාහිර පුද්ගලයන් සම්බන්ධ කරවීමේ හෝ සම්බන්ධකර ගැනීම ආදිය හෝ නොකරන බවට පොරොන්දු වෙමි.

13. මාගෙන් විශ්විද්‍යාලයටත් විශ්වවිද්‍යාලයෙන් මටත් ඉටුවිය යුතු හා ඉටුකරගත යුතු යම් කාර්යයක් හා යම් සේවාවක් වේද එය විශ්වවිද්‍යාලයේ පිළිගත් ක්‍රමවේදයට හා අනුපිළිවෙළට අනුගත වෙමින් මනාව හඳුනාගෙන එය නියමිත පිළිවෙලකට ඉටු කර ගැනීමට කටයුතු කරන බවටත්, ඉන් පරිබාහිරව අධ්‍යයන හෝ අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ තනතුරු නොතකා හරිමින් මහෝපාධ්‍යායයන් වහන්සේට හෝ ලේඛකාධිකාරිවරයාට හෝ වෙනත් නිලධාරින්ට අනවශ්‍ය බලපෑම් නොකරන බවටත් පොරොන්දු වෙමි.

14. මහෝපාධ්‍යායයන් වහන්සේ ලිඛිත පූර්ව අනුමැතියක් නොගෙන යම්කිසි සමිතියක හෝ සංගමයක නිලයක් දරන හෝ නොදරන ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා විසින් සිදුකරන මුදල් හෝ භාණ්ඩ එකතු කිරීම් ආදි කටයුතුවලට අනුබල නොදෙන අතර මමද ඒවා නොකරන බවටත් ඒවා ලඟ ගබා ගැනීමට හෝ බෙදා දීමට කටයුතු නොකරන බවටත් පොරොන්දු වෙමි.

15. විශ්වවිද්‍යාලයේ හෝ මෙම අයතනයේ සේවය කරන යම් තැනැත්තෙකුගේ හෝ යහපැවැත්මට හෝ සුභසිද්ධියට හිතකර නොවන දැන්වීමක්, පෝස්ටරයක්, විස්තර පත්‍රිකාවක්, ලියවිල්ලක් හෝ වෙනත් ප්‍රකාශයක් විශ්විද්‍යාලය තුළ හෝ ඒ අවට ලිවීම, ඇලවීම, බෙදා හැරීම, ප්‍රදර්ශනය කිරීම හෝ මාධ්‍යයකට පළකිරීම මෙන්ම ප්‍රකාශයට පත් කිරීම ද, මුද්‍රණය කිරීමද, බෙදා හැරීමද, නුසුදුසු බැවින් එවැනි කාර්යයයකට සම්බන්ධ නොවන බවටත් පොරොන්දු වෙමි.

16. විශ්වවිද්‍යාලයට පැමිණීම හා පිටවීම ප්‍රධාන දොරටුවෙන් මිස අන් ස්ථානයකින් හෝ නොකිරීමට මම පොරොන්දු වෙමි.

17. ශිෂ්‍ය භික්ෂු නමක් වශයෙන් විශ්විද්‍යාලයේ යහපත උදෙසා ලබාදිය යුතු තොරතුරු, විස්තර ආදිය නිවැරදිව ලබාදීම මගේ වගකීමක් කොට සලකන අතර එය පැහැර හැරීම හෝ අසත්‍ය හා විකෘති තොරතුරු සැපයීම ආදිය නොකිරීමට මම පොරොන්දු වෙමි.

18. විශ්විද්‍යාල භූමිය, ගොඩනැගිලි, ශාලා, උපකරණ සහ භාණ්ඩ මෙන්ම වෙනත් ද්‍රව්‍ය ආදිය අනියම් ලෙස හෝ අයතා ලෙස හෝ නියමිත හා සම්මත ක්‍රමයට පරිබාහිරව වූ කාර්යයන්ට භාවිත නොකරන බවටත්, යොදවා නොගන්නා බවටත් පොරොන්දු වෙමි.

19. විශ්වවිද්‍යාලයට අයත් බාහිර පරිසරයේ පවතින ගස්වැල් ආදිය ද වෙනත් සම්පත් ආදිය ද විශ්වවිද්‍යාලයේ පූර්ව අනුමැතියකින් තොරව ප්‍රයෝජනයට නොගන්නා බව පොරොන්දු වෙමි.

20. ශිෂ්‍ය භික්ෂූන් වහන්සේ නමක් වශයෙන් ආයතනයේ නේවාසිකව වෙසෙන කාලය තුළ ගිහි ඇඳුම් හෝ එවැනි ස්වරූපයේ ඇඳුම් හෝ දරාගෙන, කෙස් රැවුල් වවාගෙන භික්ෂු ස්වරූපයට නුසුදුසු වන අයුරින් ආයතනය තුළ හෝ ඉන් පිටත හෝ නොසිටින බවටත් පොරොන්දු වෙමි.

21. ආයතනය තුළ කිසිදු අනවශ්‍ය ශබ්ද කිරීමක් හෝ ඝෝෂා කිරීමක් හෝ එමගින් කවර හෝ අයෙකුට බාධා කිරීමක් ද නොකරන බවට පොරොන්දු වෙමි.

22. කිසිදු අවස්ථාවක මත්පැන් හා මත්ද්‍රව්‍ය භාවිතයකට යොමු නොවීමට ද පොරොන්දු වෙමි.

23. නියමිත අනුමැතියකින් තොරව කිසිදු බාහිර වාහනයක් විශ්වවිද්‍යාලය තුළට ගෙන්වා ගැනීමෙන් වැලකී සිටීමට පොරොන්දු වෙමි.

24. අසත්‍ය තොරතුරු ඉදිරිපත් කරමින් විශ්වවිද්‍යාලයෙන් කිසිදු පහසුකමක් හෝ දීමනාවක් ද ලබා නොගන්නා බවට මම පොරොන්දු වෙමි.

25. නේවාසිකාගාර නීති හා ශිෂ්‍යයන්ට බලපාන සියලුම නීතිරීති රෙගුලාසි ඒ ආකාරයෙන්ම ක්‍රියාත්මක කිරීමට වගබලා ගන්නා බවට පොරොන්දු වෙමි.

26. හැමවිට විශ්වවිද්‍යාලයට පැමිණෙන අවස්ථාවලදී මැනවින් හිස මුඩුකර භික්ෂු ආකල්ප ඇතිව පැමිණීමට පොරොන්දු වෙමි.

27. විශ්වවිද්‍යාලයේ සියලුම අධ්‍යයන කටයුතුවලට හා වෙනත් රාජකාරි අවශ්‍යතාවන්ට, දේශන ශාලාවලට, කාර්යාලවලට හා විශ්විද්‍යාලයෙන් බාහිර වෙනත් ස්ථානවලට ගමන් කරන විට අඳනය ඇඳ, පටිය බැඳ සිවුරු මැනවින් සකස්කරගෙන ඇවතුම් පැවතුම් පැවැත්වීමට වග බලා ගන්නා බවට පොරොන්දු වෙමි.

28. සෑම මාසයේම 30 හෝ 31 වැනි දා වන විට හිස මැනවින් මුඩුකර ගෙන භික්ෂු ආකල්ප ඇතිව සිටීමට වගබලා ගන්නා බව පොරොන්දු වෙමි.

29. විශ්වවිද්‍යාලය විසින් ක්‍රියාත්මක කරනු ලබන බුද්ධ වන්දනා වැඩසටහන්, ධර්මදේශනා, ධර්ම සාකච්ඡා ආදී භික්ෂූන් වහන්සේලාට අදාළ සියලුම කටයුතුවලදී ඊට අනුකූලව සහභාගී වන බවටත් පොරොන්දු වෙමි.

ඉහත 1, 2 හා 3 පිටුවල සඳහන් අංක 01 සිට 29 දක්වා ඇති නීතිරීති එලෙසම පිළිපදින බවටත්, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයේ ශිෂ්‍ය භික්ෂූන් වහන්සේ නමක් වශයෙන් ශික්ෂාකාමීව අධ්‍යයන ඉලක්ක සපුරා ගැනීමට කටයුතු කරන බවටත්, විශ්විද්‍යාලය විසින් ලබා දී ඇති ශිෂ්‍ය අත් පොතේ සඳහන් හා ඉහත දක්වා ඇති සියලුම නීතිරීති මා අතින් උල්ලංඝනය වුවහොත් ශිෂ්‍ය විනය පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ පෙන්වා දී ඇති දඬුවම්වලට අවනත වන බවටත් වෙනත් සියලු නීතිරීතිවලට එකඟව ක්‍රියා කරන බවටත් පොරොන්දු වෙමි.

............................................................ ......................................

ශිෂ්‍ය ස්වාමින් වහන්සේගේ අත්සන දිනය

**සාක්ෂි**

.................................................................................................................
පැවිදිකර වූ ආචාර්යවරයාගේ/භාරකරුගේ අත්සන සහ නිල මුද්‍රාව

............................................................................. ......................................
පැවිදිකර වූ ආචාර්යවරයාගේ/භාරකරුගේ නම දිනය

ඉහත නම සඳහන් ...................................................................................ශිෂ්‍ය ස්වාමීන් වහන්සේ හා එම ස්වාමීන් වහන්සේ පැවිදි කරවූ ආචාර්යවරයා/භාරකරු මා ඉදිරිපිට දී අත්සන කළ බවටත් මෙයින් සහතික කරමි.

.................................................................. ......................................
නීතිඥ තැනගේ අත්සන හා නිල මුද්‍රාව දිනය

ඉහත ............................................................................... ශිෂ්‍ය ස්වාමීන් වහන්සේ විසින් අත්සන් තබා සාක්ෂි සහිතව පිළිගෙන ඇති ප්‍රතිඥා පත්‍රය භාර ගතිමි.

......................................................................................... ....................................
සහකාර ලේඛකාධිකාරි (අධ්‍යයන හා ශිෂ්‍ය සේවා) දිනය